“කොවිඩ් 19 අභියෝග හමුවේ නොසැලෙන තර්ස්ටන් අපි”

ක්‍රියාකාරකම් අත්වැල

6 ශ්‍රේණිය - විද්‍යාව

තර්ස්ටන් විද්‍යාලය

කොළඹ 07

Covid 19 අභියෝග මැද නොසැලෙන තරුස්ටන් අපි
විෂයානුබද්ධ ක්‍රියාකාරකම් අත්වැල

අදහස, මග පෙන්වීම හා අධීක්ෂණය - විදුහල්පති	ප්‍රමුදිත වික්‍රමසිංහ මයා
සැලසුම් ක්‍රියාත්මක කිරීම - නි.වි. අධ්‍යාපන සංවර්ධන	එන්.ජී.එච්. සමන්තිනී මිය
6-13 සහකාර විදුහල්පති	එම්.සී. ජයසේකර මයා
6 ශ්‍රේණි ප්‍රධාන	අනෝමා ගමගේ මිය

ක්‍රියාකාරකම් පොත් සැකසීම

- 6 ශ්‍රේණිය(විද්‍යාව - සිං.මාධ්‍ය) - අයේෂා ෆොන්සේකා මිය
- 7 ශ්‍රේණිය(විද්‍යාව - සිං.මාධ්‍ය) - රාජිකා වික්‍රමසූරිය මෙවි
- 8 ශ්‍රේණිය(විද්‍යාව - සිං.මාධ්‍ය) - හංසිකා විජේතිලක මිය
- 9ශ්‍රේණිය(විද්‍යාව - සිං.මාධ්‍ය) - ජී.ඩබ්.ඩී.එස්. වෙලගෙදර මයා
- 10ශ්‍රේණිය(විද්‍යාව - සිං.මාධ්‍ය) - සුසිල් ප්‍රේමරත්න මයා
වින්දාා ජයසූරිය මිය
- 11ශ්‍රේණිය(විද්‍යාව - සිං.මාධ්‍ය) - ජී.ඩබ්.ඩී.එස්. වෙලගෙදර මයා

1 පාඩම

<u>ජෛව ලෝකයේ අසිරිය</u>

1.පරිසරය යනු අප ඇතුළුව අපගේ වටපිටාවයි.

2. පරිසරයේ ඇති දෑ ජීවීන් හා අජීවීන් ලෙස බෙදීම කළ හැක.

<u>ක්‍රියාකාරකම අංක 1</u>

A.ඔබගේ පන්ති කාමරය සහ ඒ අවට නිරීක්ෂණය කර එහි ඇති විවිධ දෑ ලැයිස්තුවක් පිළියෙල කරන්න.

B.ඉහත ලැයිස්තුවට අනුව පරිසරය තුළ ඇති වර්ධනය වන සහ වර්ධනය නොවන දෑ වගුගත කරන්න.

වර්ධනය වන දෑ	වර්ධනය නොවන දෑ

C. වර්ධනය වන දෑ හඳුන්වන නම කුමක්ද

D. වර්ධනය නොවන දෑ හඳුන්වන නම කුමක්ද?

ක්‍රියාකාරකම අංක 2

පහත සඳහන් රූප වල ඉදිරියෙන් ජීවීන් නම් කැපිටල් එල් (L) ද අජීවීන් නම් කැපිටල් එන් (N) අකුර ද යොදන්න.



( )

( )


( )



( )

( )



( )

( )

shutterstock.com · 1021040596
( )

ක්‍රියාකාරකම අංක 3

පහත සඳහන් රූප වලට අනුව ඒවා ශාක හා සතුන් ලෙස බෙදන්න.

.

A


B


C


D


E


F

.

G

ශාක	සතුන්

ක්‍රියාකාරකම 4



A



B



C

1.ඔබ පොකුණක ඇති ජලය පියවි ඇසින් නිරීක්ෂණය කළවිට ඔබට එහි ඇති ජීවීන් හඳුනා ගත හැකිද?

2.ඉහත රූප වල දක්වා ඇති ජීවීන්ගෙන් අත් කාචයකින් නිරීක්ෂණය කර හඳුනාගත හැකි ජීවියා කවරෙක්ද?

3.අත්කාචයකින් හඳුනාගත නොහැකි ජීවීන් හඳුනා ගැනීමට පාසල් විද්‍යාගාරයේ භාවිතා කරන උපකරණය කුමක්ද?

4.පියවි ඇසට නොපෙනෙන ජීවීන් කවර නමකින් හැදින්වේද?

5.ඉහත ජීවීන් අතුරින් පිදුරු පල් කළ ජලයේ සිටින ක්ෂුද්‍ර ජීවියා කවරෙක්ද ?

6.ක්ෂුද්‍ර ජීවීන් දක්නට ලැබෙන තවත් ස්ථාන තුනක් ලියන්න

ක්‍රියාකාරකම 5

පහත සඳහන් උපකරණ හඳුනාගන්න



A………………… B……………………………….

1.සංයුක්ත අන්වීක්ෂ දෙකක් ලියන්න

2.පොකුණක ඇති ජලය සංයුක්ත ආලෝක අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කරන විට එම ජල බිංදුව දමන්නේ කුමන කොටසකට ද?

3.ක්ෂුද්‍ර ජීවීන්ගෙන් සිදුවන වාසි මොනවාද?

4.ක්ෂුද්‍ර ජීවීන්ගෙන් සිදුවන හානි මොනවාද?

ක්‍රියාකාරකම 6

පසේ ක්ෂුද්‍ර ජීවින් සිටින බව හඳුනාගැනීම සඳහා ඔබ සිදුකරනු ලබන පරීක්ෂණය ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1.කැකෑරුම් නලය සෝදා තම්බා ගනු ලබන්නේ ඇයි?

2.පස් පුච්චා ගනු ලබන්නේ ඇයි?

3.කිරි නටවා භාවිතයට ගැනීමෙන් සිදුවන්නේ කුමක්ද ?

4. පුලුන් වලින් සාදාගත් ඇබ කැකෑරුම් නලය වැසීමට භාවිතයට ගනු ලබන්නේ ඇයි?

ක්‍රියාකාරකම 7



ශාක හා සතුන් අතර ඇති වෙනස්කම් ලියන්න

ශාක	සතුන්

ජීවීන් සතු ලක්ෂණ ලියන්න.

1.......................... 2.......................... 3.........................

4............................ 5..........................

ක්‍රියාකාරකම 8

මුං බීජ යොදා ගනිමින් සිදුකරන ලද පරීක්ෂණය පදනම් කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න(ක්‍රියාකාරකම් 1.5)

1.මුං බීජ මෙම පරීක්ෂණය සඳහා තෝරාගත්තේ ඇයි ?

2.මුං බීජ යෝගට් කෝප්පය තුළ සිට වීමට පෙර ඒවා ජලයේ පොගවා ගනු ලබන්නේ ඇයි?

3.යෝගට් කෝප්ප යට අඩියේ සිදුරු ඇති කරනු ලබන්නේ ඇයි.?

4.ඉහත පරීක්ෂණයේ දක්නට ලැබෙන නිරීක්ෂණ දෙකක් ලියන්න.

5.මේ අනුව වර්ධනය යනු කුමක්ද?

6. ශාක හා සත්ත්වයන්ගේ වර්ධනයේ ඇති වෙනස්කම කුමක්ද?

7.ශාක ආහාර නිපදවීමේ ක්‍රියාවලිය හඳුන්වන නම කුමක්ද ?

8.මෙම ක්‍රියාවලියේදී ශාක වායුගෝලයෙන් ලබා ගන්නා වායුව කුමක්ද?

9. ශාක වායුගෝලයට පිට කරන වායුව කුමක්ද?

10.ශාක වායුගෝලයට පිට කරන වායුවෙන් ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න.

11.ශාක වායුගෝලයෙන් ලබාගන්නා වායුවේ ඇති ප්‍රයෝජනයක් ලියන්න.

ක්‍රියාකාරකම 9

පහත දක්වා ඇති ජීවීන් අතුරින් තමා විසින්ම ආහාර නිපදවා ගන්නා ජීවීන් සහ එසේ නොවන ජීවීන් වර්ග කරන්න.

A

B.

C.

D.  E. 

F



G

තමා විසින්ම ආහාර නිපදවන ජීවින්	තමා විසින්ම ආහාර නිපදවීම සිදු නොකරන ජීවින්

A.තමා විසින්ම ආහාර නිපදවන ජීවින් හඳුන්වන නම කුමක්ද?

B.තමා විසින් ආහාර නිපදවීම සිදු නොකරන ජීවීන් හඳුන්වන නම කුමක්ද?

ක්‍රියාකාරකම අංක 10

පහත දක්වා ඇති ජීවීන්ගේ සංචරණ ක්‍රම සහ ඒ සඳහා උපයෝගි කරගන්නා උපාංගය ලියන්න

ජීවියා	සංචරණ ක්‍රමය	සංචරණ උපාංගය
ගෙම්බා		
පක්ෂීන්		
නයා		
මත්ස්‍යයා		
තලගොයා		
මිනිසා		

ක්‍රියාකාරකම 11

ක්‍රියාකාරකම 1.6ට අනුව පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1.අවර්ණ හුණු දියර සාදාගන්නා ආකාරය විස්තර කරන්න.

2.කාබන්ඩයොක්සයිඩ් වායුව හුණු දියර තුළට බුබුලනය කිරීමේදී දැකිය හැකි නිරීක්ෂණය ලියන්න.

3. මීට හේතුව කුමක්ද ?

4.ඉහත පරීක්ෂණයේ දක්නට ලැබෙන නිගමනය කුමක්ද?

ක්‍රියාකාරකම 12

1.පහත දක්වා ඇති ජීවීන්ගේ ශ්වසන අවයව නම් කරන්න

- ගෙම්බා -
- පක්ෂියා -
- මිනිසා -
- ගැඩවිලා -
- මාලුවා -
- බල්ලා -
- ඩොල්ෆින් -

2,ප්‍රජනනය යනු කුමක්ද?

3. පහත ජීවීන්ගේ ප්‍රජනනය සිදු වන ක්‍රමය ලියන්න.

පක්ෂීන් -උදා - බිත්තර මගින්

- මත්ස්‍යයා-
- ඩොල්ෆින්-
- මිනිසා -
- බැක්ටීරියා-
- කංකුං ශාකය -
- අක්කපාන ශාකය -
- බෙලි- උදා -මුල් මගින්
- කරපිංචා -
- කෙසෙල්-
- අන්නාසි-

ක්‍රියාකාරකම 13

1.පහත ශාක පැළෑටි, පඳුරු, වෘක්ෂ ලෙස බෙදන්න.

පොල් ගස, කතුරුමුරුංගා, අඹ, කොස්, ගස්ලබු, කෙසෙල්, වද මල්, රත් මල්, පිච්ච ,රෝස,

බණ්ඩක්කා ,තක්කාලි ,මිරිස්, වට්ටක්කා

පැළෑටි	පඳුරු	වෘක්ෂ

2.ඉහත වෙන් කිරීම සඳහා ශාකවල කුමන ලක්ෂණ පදනම් කරගෙන ඇතිද ?

ක්‍රියාකාරකම 14

1.පහත දැක්වෙන ජීවීන් ජීවත් වන පරිසරය අනුව බෙදන්න.

කුඹියා,සමනලයා, ඉබ්බා, අලියා, කොකා, හාවා, වවුලා, තල් මසා , මත්ස්‍යයින්, ඉස්සා, කකුළුවා

භෞමික	වායව	ජලජ

ක්‍රියාකාරකම 15

1. දෙබදුම් සුවිය සතු ලක්ෂණ තුනක් ලියන්න.

2. පහත දැක්වෙන දෙබදුම් සුවි සම්පූර්ණ කරන්න.

A.ඉබ්බා, බල්ලා, තාරකා මාළුවා, තණකොළපෙත්තා

B.තිලාපියා, ගැඩවිලා, මකුළුවා

ක්‍රියාකාරකම 16



1.ඉහත ඇති උපකරණය හඳුනාගන්න.

2.මෙය භාවිතයෙන් කුමක් මනිනු ලබයි ද.?

3. නූල ගැට ගසනු ලබන්නේ ශාකයෙ කුමන කොටසටද?

4. නූල කෙළවරට ස්කන්ධයක් සවිකර ඇත්තේ ඇයි?

බහුවරණ ප්‍රශ්න

1.සියලුම ජීවීන්,
- a.විෂම පොෂීන් වේ.
- b. සංචරණය කරයි.
- c.ආහාර නිපදවයි.
- d.ඔක්සිජන් වායුව ආශ්වාස කරයි.

2.ජීවීන් තුල ශක්තිය නිපදවීමේ ක්‍රියාවලිය,
- a. පෝෂණය වේ.
- b.ස්වසනය වේ.
- c. වර් ධනය වේ.
- d.ප්‍රජනනය වේ.

3 ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය කිරීමට වඩාත්ම සුදුසු උපකරණය වන්නේ,
- a.දුරේක්ෂය
- b.දෙනෙතිය
- c. අත් කාචය
- d. සංයුක්ත අන්වීක්ෂය

4.ප්‍රභාසංස්ලේෂණය සදහා ශක්තිය ලබා දෙන්නේ,
- a. චන්ද්‍රයා
- b. සූර් යයා
- cසුළඟ
- d.ජලය

5. ශාකවල වර් ධනය මැනීමේ උපකරණය වන්නේ,
- a.අණ්වීක්ෂය
- b. උෂ්ණත්වමානය
- c.වෝල්ට් මීටරය
- d. වෘද්ධිමානය

6.බඩගා යන සතෙක් වන්නේ,
- a.නයා
- b.තාරකා මාළුවා
- c.මකුළුවා
- d.කපුටා

7.ශාකවල ලක්ෂණයක් නොවන්නේ,
- a.චලන පෙන්වයි.
- b.හරිත ලව ඇති බව
- c.ප්‍රභාසංස්ලේෂණය කරයි.
- d. වර් ධනය ටික කලකින් නවතී.

8. ඔත් ජීවිත ගතකරන සත්වයෙකු වන්නේ,

a.ගැඩවිලා

b.මුහුදු මල

cඩොල්ෆින්

d.තාරකා මාළුවා

9.යුෂ උරා බොන සත්ත්ව කාණ්ඩය වන්නේ,

a.මීමැස්සා, සමනලයා, මකුළුවා

b.නයා, පොළඟා, මීයා

c. මාලුවා, ගිරවා, මකුළුවා

d.උකුණා, මීයා, කුඩැල්ලා

10.වාතය ලබා ගැනීම සඳහා විශේෂයෙන් හැඩගැසුනු මූල පද්ධතියක් ඇත්තේ කුමන ශාකයට ද?

a.කිරල

b.වැටකෙයියා

c. නිදිකුම්බා

d.මඬු

2 පාඩම

<u>අප අවට ඇති දේ</u>

ක්‍රියාකාරකම 1

පහත වගුව සම්පූර්ණ කරන්න.

අප අවට ඇති දේ	ස්කන්ධය ඇත	අවකාශයේ ඉඩක් ගනී
පැන		
ගල්		
ජලය		
වාතය		
ආලෝකය		
ශබ්දය		
විදුලිය		
තාපය		

a.පදාර්ථ යනු කුමක්ද?

b. ශක්තිය යනු කුමක්ද?

ක්‍රියාකාරකම් 2

පහත දී ඇති දේ ඝන,ද්‍රව,වායු ලෙස බෙදන්න.
ජලය, ඔක්සිජන් වායුව, කාබන් ඩයොක්සයිඩ් වායුව, මේසය, බැලුම,එල් පී ගෑස්, පෙට්‍රොල්,

බල්බය, පුලුන්

ඝන	ද්‍රව	වායු

ක්‍රියාකාරකම 3





a. ඉහත රූප වලට අනුව බැලූනයකින් වාතය ඉවත් වීමේදී දක්නට ලැබෙන නිරීක්ෂණය කුමක්ද ?

b.මෙයට හේතුව කුමක්ද?

c.ඉහත පරීක්ෂණයෙන් පදාර්ථයේ ඇති කුමන ලක්ෂණ පිළිබිඹු වේ ද?

d.ඉහත ලෙස ද්‍රව වලට ස්කන්ධයක් ඇති බව පෙන්වීමට පරීක්ෂණයක් සිදු කරන්න.

ක්‍රියාකාරකම අංක 4

1.ඉහත රූපයේ දක්නට ලැබෙන්නේ ද්‍රවයක පරිමාවක් මැනීම සඳහා යොදා ගනු ලබන උපකරණයකි එය කුමක්ද ?

2.ඉහත උපකරණය මගින් පාඨාංකය ගැනීමේදී අනුගමනය කළ යුතු කරුණක් ලියන්න.

3.මිනුම් සරාවේ රසදිය ඇත්නම් මාවකය දක්නට ලැබෙන්නේ කවර ආකාරයෙන්ද ඇඳ පෙන්වන්න



4.මෙම ද්‍රවයේ පාඨාංකය කුමක්ද

5. ඉහත මිනුමෙන් ද්‍රවයේ කුමන ලක්ෂණයක් පැහැදිලි වේ ද?

ක්‍රියාකාරකම 5

නිවැරදි පිළිතුර තෝරන්න

යකඩ, රබර්,රත්තරන් , අඟුරු, වැලි, කඩදාසි ,දියමන්ති

1.ඉහලම ඝණ තාවයක් ඇති ද්‍රව්‍ය කුමක්ද?

2.රළු වයනයක් ඇති ද්‍රව්‍ය කුමක්ද?

3. ප්‍රත්‍යස්ථ බවක් ඇති ද්‍රව්‍ය කුමක්ද?

4. භංගුර තාවයක් ඇති ද්‍රව්‍ය කුමක්ද?

5. ආඝන්‍යය හා තන්‍ය බව ඇති ද්‍රව්‍ය මොනවාද?

<u>බහුවරණ ප්‍රශ්න</u>

1.නිශ්චිත හැඩයක් හා නිශ්චිත පරිමාවක් සහිත ද්‍රව්‍යයක් වන්නේ,
a.ඝන b.ද්‍රව c.වායු d.ඉහත සියල්ලම

2.අඩංගු භාජනයේ සම්පූර්ණ පරිමාව අයත් කර ගන්නේ,
a.වායු b.ඝන c.ද්‍රව d. ඉහත සියල්ලම

3.ස්කන්දය මනින අන්තර්ජාතික සම්මත ඒකකය වන්නේ,
a.kg b.g c.mg d.ඉහත කිසිවක් නොවේ

4. ඝන ද්‍රව්‍යයකට උදාහරණයක් වන්නේ,
a.අයිස් b.ද්‍රව ඉටි c..ජීව වායු d.මීතෙන් වායුව

5.පහත දේ අතුරින් ශක්තියක් නොවන්නේ,
a.තාපය b.ශබ්දය c.වායුව d සූර්ය ශක්තිය

6.වාහනයක පහත කොටස් වල ලක්ෂණ මොනවාද? යා කරන්න

වාහනයේ කොටස	උදාහරණ	ලක්ෂණ
වින්ස්ක්රීනය	ලෝහ	පාරදෘශ්‍ය
වාහන බඳ	වීදුරු	විවිධ හැඩය
ප්‍රධාන ලාම්පුව	ප්ලාස්ටික්	පාරදෘශ්‍ය බව
ටයරය	රබර්	ප්‍රත්‍යාස්ථ බව
ඩැෂ් බෝඩය	වීදුරු	දෘඩ බව